(*e*) මෙම උෂ්ණත්ව අනුක්‍රමණය දණ්ඩ දිගේ විචලනය වේ ද? පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................

..........................................................................................................

(*f*) තාපමය අනවරත අවස්ථාවේ දී $T_3$ සහ $T_4$ උෂ්ණත්වමානවල පාඨාංක අතර අන්තරය $9\cdot5\ °C$ සහ ජලයේ ප්‍රවාහ ශීඝ්‍රතාව මිනිත්තුවට $120\ g$ වේ. ජලය මගින් තාපය අවශෝෂණය කරන ශීඝ්‍රතාව ගණනය කරන්න. (ජලයේ විශිෂ්ට තාප ධාරිතාව $4200\ J\ kg^{-1}\ K^{-1}$ වේ.)

..........................................................................................................

..........................................................................................................

(*g*) දණ්ඩේ හරස්කඩ වර්ගඵලය $12\cdot0\ cm^2$ නම්, ලෝහයේ තාප සන්නායකතාව ගණනය කර, පිළිතුර SI ඒකක සමග ප්‍රකාශ කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

(*h*) දුර්වල සන්නායකයක තාප සන්නායකතාව සෙවීම සඳහා සර්ල්ගේ ක්‍රමය භාවිත කළ හැකි ද? පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න.

..........................................................................................................

..........................................................................................................

3. වීදුරුවල වර්තන අංකය නිර්ණය කිරීම සඳහා සම්මත වර්ණාවලීමානයක්, වීදුරු ප්‍රිස්මයක්, සහ ඒකවර්ණ ආලෝක ප්‍රභවයක් භාවිත කරයි.

(*a*) මිනුම් ලබා ගැනීම ආරම්භ කිරීමට පෙර වර්ණාවලීමානයේ අත්‍යවශ්‍ය සීරුමාරු කිරීම් කිහිපයක් සිදු කළ යුතුව ඇත.

(i) උපනෙතෙහි සිදු කළ යුතු සීරුමාරුව කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

(ii) දුරේක්ෂය ඈතින් ඇති වස්තුවකට එල්ල කර එම වස්තුවේ පැහැදිලි ප්‍රතිබිම්බයක් හරස් කම්බි මත සෑදෙන තුරු දුරේක්ෂය සීරුමාරු කරයි. මෙම සීරුමාරුවේ අරමුණ කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

(iii) සමාන්තරකයේ දික් සිදුරෙහි සිදු කළ යුතු සීරුමාරුව කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

(iv) දුරේක්ෂය සමාන්තරකය සමග ඒකරේඛීය වන පරිදි ගෙන එනු ලැබේ. ඉන් පසු දික් සිදුරේ තියුණු ප්‍රතිබිම්බයක් හරස් කම්බි මත සෑදෙන තුරු සමාන්තරකය සීරුමාරු කරයි. මෙම සීරුමාරුවේ අරමුණ කුමක් ද?

..........................................................................................................

..........................................................................................................

[හයවැනි පිටුව බලන්න.

උසස් පෙළ විද්‍යා/ගණිත/කලා/වාණිජ හා තාක්ෂණ විෂය ධාරාවන්ට අදාල සියලුම ප්‍රශ්න පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබා ගැනීමට පිවිසෙන්න www.alevelapi.com වෙත .

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(*b*) ප්‍රිස්ම මේසය මට්ටම් කිරීම සඳහා (1) රූපයේ දැක්වෙන පරිදි ප්‍රිස්මය තබා *P*, *Q*, සහ *R* ඉස්කුරුප්පු සීරුමාරු කරනු ලැබේ.




(1) රූපය

(i) දුරේක්ෂය $T_1$ පිහිටීමේ ඇති විට දිස් සිදුරේ සමමිතික ප්‍රතිබිම්බයක් හරස් කම්බි මත ලබා ගැනීමට *Q* ඉස්කුරුප්පුව සීරුමාරු කරන ලදී. දුරේක්ෂය $T_2$ පිහිටුමට ගෙන ගිය විට දිස් සිදුරේ සමමිතික ප්‍රතිබිම්බයක් ලබා ගැනීමට කුමන ඉස්කුරුප්පුව සීරුමාරු කළ යුතු ද?

..............................................................................

(ii) ස්ප්‍රිතු ලෙවලයක් භාවිත කිරීම මගින් ප්‍රිස්ම මේසය ඉතා පහසුවෙන් මට්ටම් කළ හැකි බව ශිෂ්‍යයෙක් ප්‍රකාශ කළේ ය. මෙම ප්‍රකාශය නිවැරදි ද? පිළිතුර හේතුවෙන් පැහැදිලි කරන්න.

..............................................................................

..............................................................................

(*c*) දුරේක්ෂය $T_1$ සහ $T_2$ ස්ථානවල පිහිටන විට වර්ණාවලිමානයේ පාඨාංක පිළිවෙළින් $279° 58'$ සහ $38° 02'$ වේ. දුරේක්ෂය $T_1$ සිට $T_2$ දක්වා ගෙන යන විට එය ප්‍රධාන පරිමාණයේ ශූන්‍යය හරහා ගමන් කළ බව සලකන්න. ප්‍රිස්ම කෝණය *A* ගණනය කරන්න.

..............................................................................

..............................................................................

(*d*) දී ඇති වීදුරු ප්‍රිස්මය මගින් ආලෝක කිරණයක සිදු වන අපගමන කෝණය නිර්ණය කිරීම සඳහා ශිෂ්‍යයකු විසින් (2) රූපයේ දැක්වෙන පරිදි පතන සහ නිර්ගමන කෝණ පිළිවෙළින් $i_1$ සහ $i_2$ මැන ගන්නා ලදී. $i_1$ සමග $i_2$ හි විචලනය ප්‍රස්තාරය මගින් දැක්වේ.







(2) රූපය

මෙම තීරයේ කිසිවක් නොලියන්න

(i) අපගමන කෝණය $d$ සඳහා ප්‍රකාශනයක් ප්‍රිස්ම කෝණය $A$, සහ $i_1$, $i_2$ කෝණ ඇසුරෙන් ලියා දක්වන්න.

............................................................................................................

(ii) ප්‍රස්තාරය භාවිත කර, අවම අපගමන කෝණය $D$ නිර්ණය කරන්න.

............................................................................................................

............................................................................................................

(iii) ප්‍රිස්මය තනා ඇති විදුරුවල වර්තන අංකය ගණනය කරන්න.

............................................................................................................

............................................................................................................

4. විද්‍යුත් ගාමක බලය (emf) $E$ ($< E_0$) වන දී ඇති කෝෂයක අභ්‍යන්තර ප්‍රතිරෝධය $r$ නිර්ණය කිරීම සඳහා භාවිත කළ හැකි 4 m දිග කම්බියක් සහිත විභවමානයක පරීක්ෂණ ඇටවුමක් (1) රූපයේ දැක්වේ.




(1) රූපය

(*a*) මිනුම්වල නිරවද්‍යතාවට බලපාන විභවමාන කම්බියක තිබිය හැකි ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

............................................................................................................

............................................................................................................

(*b*) (1) රූපයේ දක්වා ඇති විභවමානය සීරුමාරු කළ හැකි පරාසයක් සහිත වෝල්ට්මීටරයක් සේ භාවිත කළ හැකි ද? පිළිතුරට හේතු දක්වන්න.

............................................................................................................

............................................................................................................

(*c*) ශිෂ්‍යයෙක්, ගැල්වනෝමීටරය තුළින් ධාරාව නොගලන විට දී ද එහි කුඩා උත්ක්‍රමණයක් නිරීක්ෂණය කළේ ය. මෙම ගැල්වනෝමීටරය මෙම පරීක්ෂණය සඳහා භාවිත කිරීම යෝග්‍ය වේ ද? පිළිතුරට හේතු දක්වන්න.

............................................................................................................

............................................................................................................